## **පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය.**

**අභියාචනා අංක:- AAT/27/2025 (PSC)**

ඩී.කුසලානි ද සිල්වා
**අභියාචක**
**එදිරිව,**
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය : 2026.01.06**

| | | |
|---|---|---|
| **ඉදිරියේ දී** | **විනිසුරු කේ.ටී.චිත්‍රසිරි** | **(සභාපති)** |
| | **ජේ.ජේ.රත්නසිරි** | **(සාමාජික)** |
| | **එස්.නන්දසේකරන්** | **(සාමාජික)** |

පෙනී සිටීම :- අභියාචක සිටී.
අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක තිස්ස ගුණතිලක මහතා.
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් සචිනි රඹුක්කමගේ මහත්මිය.

**-නියෝගය-**

**ජේ.ජේ.රත්නසිරි මැතිතුමා (සාමාජික) පරි.අභි.විනි.අධිකාරය**

අභියාචක කුසලානි ද සිල්වා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිළධාරිනියකි. 2022.01.01 දින ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියට උසස්වීම් ලැබූ මෙම අභියාචක අදාළ ශ්‍රේණියේ තනතුරක රාජකාරී භාර නොගැනීම නිසා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ තනතුරට පත්කිරීම අවලංගු කර නැවත පළමු ශ්‍රේණියට පත් කර ඇත. ඉන් පසුව නැවත විශේෂ ශ්‍රේණියේ තනතුරක පත්වීම් 2024.04.24 දින පත්කරනු ලැබ ඒ පත්වීම භාරගත් 2024.04.25 දින සිට නැවත ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ තනතුරට පත් කර ඇත. අභියාචනය 2025.11.20 දින අභියාචනයක් මෙම අධිකාරය ඉදිරියේ කරමින් ඉල්ලා සිටින්නේ;

"මාගේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියට උසස්වීම 2022.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි හිඟ වැටුප් සහ දීමනා සහිතව පෙරදාතම් කර දෙන ලෙසය.

අභියාචකගේ මෙම ඉල්ලීම සාධාරණද, අභියාචකට අදාළ තනතුරු භාර ගැනීමට අපහසු වන ඇයගේ පාලනයෙන් තොර හේතු තිබුණාද? ඒ සඳහා අභියාචක උත්සාහයක් දරා තිබුණාද යන්න විමසා බැලිය යුතුය. එසේම එය ඉටු කර දිය හැකිද? එසේ කිරීම තුළින් ඇතිවන ප්‍රතිවිපාක මොනවාද යන්න මෙම අධිකාරය විසින් පරීක්ෂා කර බලන ලදී.

එසේම, අභියාචක විසින් ඉදිරිපත් කරන ලද ලිපි ලේඛන අනුවම ඇමුණුම 6 මෙහි ආරම්භයක් සනිටුහන් වී ඇත. ඒ අනුව 76/1/15 විශේෂ XVII හා 2022/6/6 රාජ්‍ය පරිපාලන ලේකම්ගේ දැන්වීම් අනුව 2022/1/1 දිනට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩු තනතුරු 42 ක් පිරිවීම සඳහා සුදුසුකම් ලැබූ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පංතියේ නිළධාරීන් අතරින් අයදුම්පත් කැඳවා ඇත. 2022.06.24 දිනට පෙර අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස උපදෙස් දී ඇත. ඒ අයදුම්පත් අතරින් ජ්‍යෝෂ්ඨතාවය මත 53 දෙනෙකු සම්මුඛ පරීක්ෂණයට කැඳවා ඇත. ඇමුණුම් 07 අනුව 2022.11.25 දින ලිපිය පරිදි, අභියාචක 2022.01.01 දින සිට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කර පත්වීම් දී ඇත. ඒ අනුව අභියාචකට අදාළ ශ්‍රේණියේ තනතුරක පත්වීම් භාරගත යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් නිකුත් කළ 1/2021 දරන 2021.06.30 චක්‍රලේඛනය මඟින් පැහැදිළි කර ඇත.

1. දීපව්‍යාප්ත සේවාවන්හි විශේෂ ශ්‍රේණියට ඉදිරියේදී උසස්වීම් ලබන නිලධාරීන් එම සේවයේ විශේෂ ශ්‍රේණිය යටතේ අනුමත කර ඇති තනතුරකට පත්කරනු ලබන අවස්ථාවකදී එම පත්වීම් ලිපිය ලද දින සිට සති 02ක කාලයක් තුළනව තනතුරේ වැඩ භාර ගැනීමට කටයුතු කළ යුත්තේය. එලෙස රාජකාරී සඳහා සති 02ක් තුළ වාර්තා නොකරනු ලබන නිලධාරීන්ගේ විශේෂ ශ්‍රේණියේ උසස්වීම් අවලංගු කිරීමට කටයුතු කරනු ලැබේ.

2. දීපව්‍යාප්ත සේවාවන්හි විශේෂ ශ්‍රේණියට උසස්වීම් ලැබ ඇති නමුත් පහළ ශ්‍රේණියක තනතුරක දැනට සේවය කරනු ලබන විශේෂ ශ්‍රේණියේ නිලධාරීන්, සේවා අවශ්‍යතාවය පරිදි එක් එක් සේවාවන්හි විශේෂ ශ්‍රේණිය යටතේ අනුමත කර ඇති තනතුරු සඳහා 2021.08.31 දිනට පෙර පත්කිරීමට එම සේවාවන්හි පරිපාලන බලධරයන් විසින් අවශ්‍ය කටයුතු කළ යුතුය.
3. දීපව්‍යාප්ත සේවාවල විශේෂ ශ්‍රේණියේ තනතුරකට දැනටමත් පත් කර ඇති නමුත් මේ දක්වා විශේෂ ශ්‍රේණියේ තනතුරෙහි රාජකාරි සඳහා වාර්තා නොකළ නිලධාරීන්ට විශේෂ ශ්‍රේණියේ තනතුරෙහි රාජකාරී සඳහා වාර්තා කිරීමට 2021.07.31 දක්වා කාලය ලබා දී එදින සිට ලිත් මසක් ඇතුළත තනතුර භාර නොගන්නා නිලධාරීන් ස්වකැමැත්තෙන් තනතුර අතහැරගිය නිලධාරීන් ලෙස සලකා ඉදිරි කටයුතු කිරීමට පරිපාලන බලධරයන් විසින් කටයුතු කළ යුතුය.

මේ අනුව පත්වීම් ලැබ සති 02 ක් ඇතුළත අදාළ තනතුරක වැඩ භාරගත යුතුය.

එසේ වුවත් අභියාචක ඇමුණුම 09 පරිදි 2023.01.04 දින මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් මඟින් ප්‍රියමනාප සේවා ස්ථානයක් වූ තමා ඒ අවස්ථාව වන විට සේවය කළ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පංතියේ තනතුරක තවදුරටත් සේවය කිරීමට අවස්ථාව සළසා දෙන ලෙස ඉල්ලා ඇත. ඇමුණුම 11 මඟින් රාජ්‍ය පරිපාලන ලේකම් වෙනුවට අධ්‍යක්ෂක ශ්‍රී ලංකා පරිපාලන සේවයේ අභියාචකට දන්වා ඇත්තේ, 2023.03.17 දින දරන PSC/PRO/7/1811/2022 අංක දරන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලිපිය මඟින් අදාළ ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇති බවය. ඒ බැව් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් 2023.03.30 දින අභියාචක දැනුවත් කර ඇත. එසේ වුවත් සුදුසු තනතුරක පත්වීම් භාර ගැනීම වෙනුවට අභියාචක නැවතත් 2023.04.03 දින ඇමුණුම 17 මඟින් ඉල්ලීම් කරමින් දැනට තමා රාජකාරී කරන තනතුරේ තවදුරටත් රාජකාරී කිරීමට අවස්ථාව සළසා දෙන ලෙස ඉල්ලා සිටී.

මේ අතරතුර රාජ්‍ය පරිපාලන ලේකම් විසින් 2023.05.02 දින අභියාචක කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය යටතේ වන මිනිස් බල හා රැකිරක්ෂා

දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ තනතුරට පත් කර යවා ඇත. අභියාචක එම තනතුර භාර ගෙන නොමැත. ඉන්පසුව නැවත 2023.07.19 දින රාජ්‍ය පරිපාලන ලේකම් විසින් අභියාචක ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සුදුසු තනතුරකට ස්ථානගත කර ඇත. එම අවස්තාවද අභියාචක මගහැර ඇත. ඒ අවස්ථාවේ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් ඇමුණුම් 20 ලිපිය මඟින් ඒ බැව් අදාළ අංශ දැනුවත් කර ඇත.

2023.09.16 දින ලිපිය මඟින් ඇමුණුම් 21 අනුව සති 02 තුළ අදාළ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරක රාජකාරී භාර නොගෙන නම් පත්වීම් අවලංගු කරන බව දන්වා ඇත. අභියාචක විසින් ඒ අවස්ථාවේදී පත්වීම් භාර ගැනීම වෙනුවට 2023.04.21 දින AAT/80/2023 (PSC) යටතේ මෙම අධිකාරයට අභියාචනයක් ගොනු කර ඇත. ඒ හා සමාන නිළධාරියකු ඩබ්.ආරියරත්න නැමැති අයද අභියාචනයක් ඉදිරිපත් කර ඇත.

ඒ තත්ත්වය මෙසේ තිබියදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2024.01.19 දින ඇමුණුම 26 ලිපිය මඟින් අභියාචක ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ පත්වීම් අවලංගු කර ඒ බව අභියාචකට දන්වා ඇත. මෙම අධිකාරයේදී පැවති අභියාචනය, විභාගය යටතේ 2024.03.22 දින අභියාචනය ඉල්ලා අස් කර ගැනීමට යටත්ව නිශ්ප්‍රභා කර ඇත. එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2024.02.06 දින ඉදිරිපත් කරන ලද ලිපියේ 5 ඡේදය අනුව කටයුතු කිරීමට එකඟ වී ඇත.

> 05. The Commission decided that Mrs.D.K. de Silva and Mr. N.W.Aruyarathne to promote to the Special Grade of Sri Lanka Administrative Service Which will be effective from the day they assume duties, in special grade posts.

ඇමුණුම 31 යටතේ 2024.02.10 දින ආතිරේක ලේකම් රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් අභියාචකට

ඒ අනුව දන්වා පත්වී යාමට කැමති ස්ථාන 03 ක් දන්වා එවන ලෙසද උපදෙස් දී ඇත. ඒ දැනුම්දීම පරිදි 2024.02.27 දින ස්ථාන 03 ක් නම්කර ඇත. අදාළ ඉල්ලීම අනුව 2024.03.04 දින අභියාචක ජනමාධ්‍ය අමාත්‍යාංශයේ පුරප්පාඩුවක් සඳහා අනුයුක්ත කර ඇත. ඉන් පසුව 2024.03.21 ඇමුණුම් 37 ලිපිය පරිදි අභියාචක දුම්රිය දෙපාර්තමේන්තුව සඳහා අනුයුක්ත කර ඇත. 2024.04.24 දින ඇමුණුම් 41 ලිපිය මඟින් අභියාචක මෝටර් ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙතින් නිදහස් කර ඇත. ඇමුණුම 42 ලිපිය පරිදි අභියාචකට 2024.04.25 දිනට අදාළ තනතුර රාජකාරී භාරගත් බව දක්වා ඇත. ඒ අනුව පෙර පැවති තීරණ වලට අනුකූලව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2024.07.03 දින ලිපිය ඇමුණුම 43 මඟින් අභියාචක 2024.04.25 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ තනතුරකට පත්කර ඇත. එම ක්‍රියාවලිය තුළ අභියාචකට අසාධාරණයක් සිදුවී ඇති බැව් නොපෙනේ.

පහත සඳහන් නිරීක්ෂණද මේ අවස්ථාවන්හිදී ඉදිරිපත් කිරීම සුදුසුය.

I. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ සුදුසුකම් සපුරා ඇති නිළධාරීන් සිටියදී විශේෂ ශ්‍රේණියේ තනතුරක පුරප්පාඩුව පැවතීම සුදුසු නොවන බව.

II. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ සුදුසුකම් සපුරාලන ජ්‍යෝෂ්ඨතා ලේඛනයේ ඊළඟට සිටින නිළධාරීන්ට සිදුවන අවස්ථාව අහිමි වීම.

III. පුරප්පාඩු තනතුරේ වෙනත් අඩු සුදුසුකම් සහිත පුද්ගලයකු වැඩ බැලීම/ රාජකාරී ඉටු කිරීමට පත් කිරීමට සිදු වීම.

IV. ඒ සඳහා වැඩ බැලීමට/ආවරණයට පත් කළ පුද්ගලයන්ට අමතර වැටුප්, දීමනා, වරප්‍රසාද දීමට සිදුවීම.

V. අභියාචක ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ පත්වීම් ලැබ පළමු ශ්‍රේණියේ පහළ තනතුරක තවදුරටත් රාජකාරී කිරීම. එසේ වුවත් ඉහළ තනතුරක වැටුප්, දීමනා,වරප්‍රසාද භුක්ති විඳීම.

VI. සියළු සුදුසුකම් සපුරා ඇතත් පුරප්පාඩු සීමිත වීම් මත ඊළඟට ජ්‍යෝෂ්ඨතා ලේඛනයේ සිටින පිරිස අපහසුතාවයට පත්වීම.

VII. පරිපාලනමය ලෙස පරිපාලන බළධාරීන් පත්වන අපහසුතා.

වැනි සියළු කරුණු සැළකීමේදී 1/2021 චක්‍රෙල්ඛනයට අනුව කටයුතු කිරීම තුළ අභියාචකට අසාධාරණයක් සිදුවී නැත. ඒ අනුව අභියාචකගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරමු. ඒ බැව් අභියාචක, ලේකම්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය, ලේකම්,රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වා යවන්න.

අභියාචනය ප්‍රතික්ෂේප කර ඇත.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

දෙව්මිනි/